# සැබවින්ම සතුටු විය හැක්කේ කෙසේද?



# සැබවින්ම සතුටු විය හැක්කේ කෙසේද?

මේ පත්‍රිකාව සම්පුර්ණයෙන්ම කියවන තුරු ඉවතට විසි නොකරන්න. යේසුතුමන්ට ඔබගේ ජීවිතය වෙනස්කර, ඔබගේ ප්‍රශ්නයට විසඳුමක් දීමට පුළුවන.

සැබවින්ම, ඔබ සමාදානය, ප්‍රීතිය, සෙව්ව නමුත්, එය ඔබට නොලැබී තිබෙනවා විය හැක. මිලියන ගණන් සෙනග දුම්බිමෙන්, මත්පැන් පානයකිරීමෙන්, මත්ද්‍රව්‍ය ගැනීමෙන්, නැටීමෙන්, සුදුකෙලිමෙන් සහ ලිංගික දුරාචාරයෙහි යෙදීමෙන්, සමාදානය සහා ප්‍රීතිය ලබාගැනීමට නිෂ්ඵලයේ ප්‍රයත්න දරා ඇත. සතුට ලබාගන්නවා වෙනුවට, ඔවුන් අධි වේදනාකාරී මානසික දොම්නසෙහි සහ රෝගපිඩාවෙහි අගුල්ලා සිටින ආකාරය දකිනු ලබයි. සමහරුන්, නෂ්ඨාපෙක්ෂාවෙන්, බලාපොරොත්තුවක් නොමැතිව සියදිවි හානි කරගනිති.

ප්‍රියමිත්‍රය, සැබෑ සතුටෙහි රහස ඉතාමත් සරළය. වර්ෂ ගණනාවකට පෙර මමත් පාපකාරී ජීවිතය නිසා මානසිකව ව්‍යවුල් තත්වයකයි පසුවූයේ. කිතුණු දහම ඇතුළු, බොහෝ ධර්මයන් තුළින්, මා සතුට සෙව්වත්, මට එය සම්බ වුනේ නැත. මා බොහෝ වැදගත් සහ ධාර්මික ජනතාව සොයා ගියෙමි. ලෝකයේ ප්‍රභූවරුන් විසින් ලියනලද, සදාචාරය සහ අචාරවිද්‍යාව පිළිබඳ බොහෝ පොත් මා කියෙව්වෙමි. එහෙත් එහි ප්‍රතිපලය, ව්‍යවුල්භාවය සහා මුළාවීමයි. යම් අවස්ථාවන්හිදී, මට ජිවත්වීමටද හේතුවක් සම්බනොවිය.



දිනක් මාගේ මුළු දිවියම චමත්කාරජනක ලෙස මාරු විය. යේසුකිතුතුමන් මට ප්‍රකාශ වී, එතුමාණන් මාගේ සියලු පාප සහ

රෝග උදෙසා මියගිය බවත්, මා එතුමාණන්ව අදහා මාගේ පාප උන්වහන්සේට කියාසිටි නම්, උන්වහන්සේ මට කමාව දානය කර, මාගේ කාලකන්ණි කිලුටු දිවිය මාරුකරන බවට පැවැසූ එම දිනයයි.

යේසුතුමන්ට මාගේ හද ගැඹුරින් මා හැඬුවෙමි. මාගේ සියළු පාපයන්ට මා කමාව අයැද සිටි අවස්ථාවේදී, කල්වාරී කුරුසේදී මා උදෙසා හෙළු ඒ අනර්ඝ ලේ මාව පිරිසිදු කළෙහිය. මට ඉමහත් සහනයක් දැනුණි. මේ දක්වා මාව බාරකරමින් තිබු හිමාලයානු කඳු දහස් ගණනක්, අතුරුදහන් වුවාක්මෙන් මට දැනුණි. සංසිදුවන හැඟීමකි: “සියලු දැනගන්ම ඉක්මවා යන සමාදානය;” සියලු මනුෂ්‍යය විස්තර කිරීම් තර්ජනයට ලක්කරමින්, මාගේ මුළු පැවැත්ම තුලින්ම පැතිර ගියෙහිය. ස්වර්ගීය ප්‍රීතිය, මාගේ හදවතෙහි සහ හදවත




තුළින් දෝරගලන්නට විය. කිතුතුමන් මාගේ දිවියට වැඩම කර රජවරුන්ගේ රජ ලෙස සහ ස්වාමිවරුන්ගේ, ස්වාමින්වහන්සේ ලෙස, සිංහාසනාරුඪවීම මා අත්දැක්කෙමි. එදින පටන් මාගේ දවියෙහි නව අර්ථයක් තිබෙන බව මට වැටහුණි. දියවැඩියාව, ඇදුම රෝගය, අර්ශස් රෝගය, උණ සන්නිපාතය, සෙංගමාලය වැනි භයානක රෝග වලින්ද එතුමාණෝ මා සුවකළසේක. දැන් මා ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස් වහන්සේ තුළින් මා ප්‍රීතිමත්, නිරෝගී මිනිසෙකි.

මේ දැන්, ඔබත් යේසුකිතුතුමන්ව, ඔබගේ දෙවිතුමන් සහ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන, ඔබගේ සියලු පාප කියා

සිටින්නේහිනම්, අද දින ඔබටද, මේ සියල්ල සහ තව බොහෝ විස්මයජනක අත්දැකීම් රසවිඳිය හැකිය. "අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්නටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක."



"යේසුස්වහන්සේගේ ලේද සියලු පාපවලින් අප පවිත්‍රකරන්නේය." එලෙසම ඔබට, මානසික හෝ ශාරීරික රෝගයක් තිබෙනම්, එතුමන්ට ඔබට සුවය සහා ප්‍රීතිය දානය කළ හැක. ''එහෙත්, එතුමන්(යේසුස්) තුවාළ ලැබුවේ අපේ අපරාධ නිසා ය; පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය. එතුමන් ලත් දඬුවමින් අපට සාමදානය ලැබී ඇත; එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත.'' (යෙසාය 53:5). "(යේසුතුමන්) සියලු රෝගීන් සුවකළසේක."

**කාරුණිකව, මේ මොහොතෙම යාඥා කරන්න:**

**"ස්වාමිවූ යේසුස්වහන්ස, ඔබවහන්සේ මාගේ දෙවිතුමන් සහ ගැලවුම්කරුවාණන් බව මා අදහමි. මට කමාවී, ඔබවහන්සේගේ අනර්ඝ රුධිරයෙන් මාගේ සියලු පාප සෝදා දැමුව මැනව. මාගේ හදවතට වැඩිය මැනව. මේ මොහොතෙම මා ගළවා, සුවකර මැනව. යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලමි. ආමෙන්:"**



"ස්වාමිවූ (යේසුතුමන්ව) විශ්වාස කරන කව්රු නුමුත්, ප්‍රීතිමත් තැනැත්තෙක්ය."

